# පුරප්පාඩු

## රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

## සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් කාර්යශූර, ස්වයංගාමක, වෘත්තීය උන්නතිගාමී කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කළ හැකි අයවලුන් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සමග අත්වැල් බැඳ ගැනීම අපි අපේක්ෂා කරමු.

**සෑම අයදුම්කරුවෙකුම,**

(i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ii) තනතුරේ වගකීම් නිසිලෙස ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි මනා ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
(iii) මනා චරිතයකින් යුක්ත අයෙකු විය යුතුය.

1. කළමණාකරු - නිෂ්පාදන **(MM 1-1 – II ශ්‍රේණිය )**

**සුදුසුකම්**
**බාහිර අයදුම්කරුවන්**

(අ) (i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් ස්වාභාවික විද්‍යාව, ඖෂධවේදය හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පළමු උපාධියක්,

හෝ

(ii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් /ආයතනයකින් ලබා ගත් වෙනත් සමාන උපාධියක්,

සහ

(ආ) පරිගණක සාක්ෂරතාවය

සහ

(ඇ) අදාළ සුදුසුකම් ලැබීමෙන් පසු ඖෂධ නිෂ්පාදන ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 05 ක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වූ අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

හෝ

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරු (JM 1-1) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

- වැටුප් පරිමාණය : MM 1-1 - රු. [91,690 – 10 x 2,480 – 15 x 3,450 = 168,240]
 (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි II වන උපලේඛනයට අනුව, රු. 91,690/= ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලබන අතර 2025 වර්ෂය සඳහා ආරම්භක වැටුප රු. 71,730/= කි.)
 ඉහත වැටුප් වලට අමතරව, රජයේ අනුමත දීමනා ද ගෙවනු ලැබේ.

- වයස : අවුරුදු 22ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45ට වැඩි නොවිය යුතුය.
 අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

- බඳවාගැනීමේ ක්‍රමය : ලිඛිත තරග විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 2. සහකාර ඉංජිනේරු - (JM 1-1 - II ශ්‍රේණිය)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

1. (අ) මොරටුව විශ්ව විද්‍යාලය හෝ ඊට සමාන ආයතනයකින් නිකුත් කරන ලද යාන්ත්‍රික / විදුලි /ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රයට අදාළ ජාතික තාක්ෂණ ඩිප්ලෝමා (NDT) සහතිකය.

සහ

(ආ) පරිගණක සාක්ෂරතාවය,

සහ

(ඇ) රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක/මණ්ඩලයක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක යාන්ත්‍රික / විදුලි /ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රයට අදාළ, සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 6 ක පළපුරුද්ද.

හෝ

2. (අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් ඉංජිනේරු උපාධිය

සහ

(ආ) රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක යාන්ත්‍රික / විදුලි /ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රයට අදාළ, සුදුසුකම් ලැබීමෙන් පසු වසරක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වූ අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

හෝ

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ 'කළමනාකරණ සහකාර - තාක්ෂණික' (MA 2- 1) ශ්‍රේණියේ II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

- වැටුප් පරිමාණය : JM 1-1 - රු. [72,650 – 10 x 1,360 – 18 x 2,040 = 122,970]
(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි II වන උපලේඛනයට අනුව, රු. 72,650 /= ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලබන අතර 2025 වර්ෂය සඳහා ආරම්භක වැටුප රු. 58,615/= කි.)

- වයස : අවුරුදු 22ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45ට වැඩි නොවිය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

- බඳවාගැනීමේ ක්‍රමය : ලිඛිත තරග විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 3. පුද්ගලික ලේකම් (JM 1-1 – II ශ්‍රේණිය)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

(අ) ලේකම්වරුන්ගේ වරලත් ආයතනයේ "වරලත් ලේකම්" සහතිකය

සහ

(ආ) මිනිත්තුවකට වචන 40ක යතුරු ලියන වේගයක් හා මිනිත්තුවකට වචන 80ක ලඝු ලේඛන වේගයක් තිබිය යුතුය.

සහ

(ඇ) පරිගණක සාක්ෂරතාවය

සහ

(ඈ) රජයේ දෙපාර්තමේන්තුවක /සංස්ථාවක /මණ්ඩලයක /ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ලේකම් කාර්යයන් පිළිබඳ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(1) ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම

හෝ

(2) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන II ශ්‍රේණියේ (MA) තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

- වැටුප් පරිමාණය : JM 1-1 - රු. [72,650 – 10 x 1,360 – 18 x 2,040 = 122,970]
(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි II වන උපලේඛනයට අනුව, රු. 72,650 /= ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලබන අතර 2025 වර්ෂය සඳහා ආරම්භක වැටුප රු. 58,615/= කි.)

- වයස : අවුරුදු 22ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45ට වැඩි නොවිය යුතුය.
  අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

- බඳවාගැනීමේ ක්‍රමය : ලිඛිත තරග විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 4. තත්ත්ව පාලන නිලධාරී - (JM-1-1 - II ශ්‍රේණිය)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, රසායන විද්‍යාව විෂය ඇතුළුව විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය හෝ රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ සමාන සුදුසුකම්.

සහ

(ආ) පරිගණක සාක්ෂරතාවය

සහ

(ඇ) සුදුසුකම් ලැබීමෙන් පසු ඖෂධ හෝ ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වූ අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

හෝ

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ "කළමනාකරණ සහකාර -තාක්ෂණික" (MA 2-1) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක් (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

- වැටුප් පරිමාණය : JM 1-1 - රු. [72,650 – 10 x 1,360 – 18 x 2,040 = 122,970]
  (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි II වන උපලේඛනයට අනුව, රු. 72,650 /= ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලබන අතර 2025 වර්ෂය සඳහා ආරම්භක වැටුප රු. 58,615/= කි.)

- වයස : අවුරුදු 22ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45ට වැඩි නොවිය යුතුය.
  අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

- බඳවාගැනීමේ ක්‍රමය : ලිඛිත තරග විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 5. ඖෂධ තාක්ෂණ ශිල්පී - නිෂ්පාදන (MA -2-1 - III ශ්‍රේණිය)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් - පහත (අ), (ආ) හෝ (ඇ)**

(අ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ඖෂධ නිෂ්පාදන ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට (NVQ 5) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාගෙන තිබීම.

(ආ) (i) අ.පො.ස (සා.පෙළ) විභාගයේදී සිංහල/දෙමළ, විද්‍යාව, ඉංග්‍රීසි සහ ගණිතය ඇතුළුව සම්මාන 04ක් සමඟ විෂයයන් 06ක් සමත් වී තිබීම.

සහ

(ii) අ.පො.ස. (උ/පෙළ) විභාගයේ විද්‍යා හෝ තාක්ෂණ විෂය ධාරාවෙන් (පොදු ප්‍රශ්න පත්‍රය හැර) විෂයයන් තුනක් (03) සමත් වීම

සහ

(iii) මාස හයකට නොඅඩු පරිගණක පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

සහ

(iv) ක්ෂේත්‍රයට අදාළ පිළිගත් ඖෂධ නිෂ්පාදන ආයතනයක අවම වශයෙන් වසර දෙකක (2) පළපුරුද්ද.

(ඇ) අභ්‍යාසලාභීන් බඳවා ගැනීම

ඉහත (ආ) (i), (ii) සහ (iii) සුදුසුකම් සහිත අභ්‍යාසලාභීන් ලෙස බඳවා ගැනීම

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ පුහුණුවන ඖෂධ තාක්ෂණ ශිල්පී ලෙස වසර 1 ½ ක පුහුණු කාලයක් සම්පූර්ණ කළ පසු හා ලිඛිත තරග විභාගයෙන් සමත් වූ අයවලුන් ඖෂධ තාක්ෂණ ශිල්පී - නිෂ්පාදන ලෙස ස්ථිර සේවයට බඳවාගනු ලැබේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වූ අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

- වැටුප් පරිමාණය : MA 2-1 : රු. [50,540 – 10 x 540 – 7x 630 – 4 x 890 -20 x 1,190 – 87,710] (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන II ට අනුව, රු. 50,540/= ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලබන අතර 2025 වර්ෂය සඳහා ආරම්භක වැටුප රු. 43,379/= කි)
- වයස : අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
අභ්‍යන්තර අයදුම්කරුවන්ට ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

- බඳවා ගැනීමේ ක්‍රමය: ලිඛිත තරඟ විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 6. නඩත්තු තාක්ෂණ ශිල්පී - (විදුලි/ ඉලෙක්ට්‍රොනික/ යාන්ත්‍රික සහ වායු සමීකරණය) (MA -2-1 - III ශ්‍රේණිය)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

(අ) ක්ෂේත්‍රයට අදාළ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට (NVQ 5) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම

- වැටුප් පරිමාණය : MA 2-1 : රු. [50,540 – 10 x 540 – 7x 630 – 4 x 890 -20 x 1,190 – 87,710] (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන II ට අනුව, රු. 50,540/= ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලබන අතර 2025 වර්ෂය සඳහා ආරම්භක වැටුප රු. 43,379/= කි)

- වයස් සීමාව : අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට වඩා නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

- බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත තරඟ විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 7. සැලසුම් සහ ප්‍රසම්පාදන සහකාර (MA 2 -1–III ශ්‍රේණිය)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් - පහත (අ) හෝ (ආ)**

(අ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට (NVQ 5) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාගෙන තිබීම.

(ආ) (i) අ.පො.ස (සා.පෙළ) විභාගයේදී සිංහල/දෙමළ, විද්‍යාව, ඉංග්‍රීසි සහ ගණිතය ඇතුළුව සම්මාන 04ක් සමඟ විෂයයන් 06ක් සමත් වී තිබීම.

සහ

(ii) අ.පො.ස. (උ/පෙළ) විභාගයේ විද්‍යා හෝ තාක්ෂණ විෂය ධාරාවෙන් (පොදු ප්‍රශ්න පත්‍රය හැර) විෂයයන් තුනක් (03) සමත් වීම

සහ

(iii) මාස හයකට නොඅඩු පරිගණක පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම

- වැටුප් පරිමාණය : MA 2-1 : රු. [50,540 – 10 x 540 – 7x 630 – 4 x 890 -20 x 1,190 – 87,710] (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන II ට අනුව, රු. 50,540/= ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලබන අතර 2025 වර්ෂය සඳහා ආරම්භක වැටුප රු. 43,379/= කි)

- වයස් සීමාව : අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට වඩා නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

- බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත තරඟ විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 8. තත්ත්ව පාලන තාක්ෂණ ශිල්පී - (MA 2-1 – III ශ්‍රේණිය)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් [පහත (අ) ,(ආ) හෝ (ඇ) ]**

අ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ඖෂධ නිෂ්පාදන ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට (NVQ 5) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාගෙන තිබීම.

(ආ) (i) අ.පො.ස (සා.පෙළ) විභාගයේදී සිංහල/දෙමළ, විද්‍යාව, ඉංග්‍රීසි සහ ගණිතය ඇතුළුව සම්මාන 04ක් සමඟ විෂයයන් 06ක් සමත් වීම.

සහ

(ii) අ.පො.ස (උ.පෙළ) විභාගයේදී රසායන විද්‍යාව (සාමාන්‍ය ප්‍රශ්න පත්‍රය හැර) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව සම්මාන 2ක් සමඟ තනතුරට අදාළ විද්‍යා හෝ තාක්ෂණික විෂයයන් තුනක් (03) සමත් වීම.

සහ

(iii) මාස හයකට නොඅඩු පරිගණක පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

සහ

(iv) පිළිගත් රසායනාගාරයක අවම වශයෙන් අවුරුදු දෙකක (2) විශ්ලේෂණාත්මක පළපුරුද්ද.

(ඇ) පුහුණුවන්නන් බඳවා ගැනීම

ඉහත (ආ) (i), (ii) සහ (iii) සුදුසුකම් සහිත අයවලුන් පුහුණුවන්නන් ලෙස බඳවා ගැනීම.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ පුහුණුවන තත්ත්ව පාලන තාක්ෂණ ශිල්පී ලෙස වසර 1 ½ ක පුහුණු කාලයක් සම්පූර්ණ කළ පසු හා ලිඛිත තරග විභාගයෙන් සමත් වූ අයවලුන් ඖෂධ තාක්ෂණ ශිල්පී - නිෂ්පාදන ලෙස ස්ථිර සේවයට බඳවාගනු ලැබේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම

- වැටුප් පරිමාණය : MA 2-1 : රු. [50,540 – 10 x 540 – 7x 630 – 4 x 890 -20 x 1,190 – 87,710] (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන II ට අනුව, රු. 50,540/= ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලබන අතර 2025 වර්ෂය සඳහා ආරම්භක වැටුප රු. 43,379/= කි)

- වයස් සීමාව : අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට වඩා නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

- බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත තරඟ විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 9. ගබඩා භාරකරු (MA 2 -1–III ශ්‍රේණිය)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් - පහත (අ) හෝ (ආ)**

(අ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ඖෂධ නිෂ්පාදන ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට (NVQ 5) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

(ආ) (i) අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ, විද්‍යාව, ඉංග්‍රීසි සහ ගණිතය ඇතුළුව සම්මාන 04ක් සහිතව විෂයයන් 06ක් සමත් වීම.

සහ

(ii) අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් තනතුරට අදාළ ඕනෑම විෂය ධාරාවකින් (සාමාන්‍ය ප්‍රශ්න පත්‍රය හැර) විෂයයන් තුනක් (03) සමත් වීම.

සහ

(iii) මාස හයකට නොඅඩු පරිගණක සහතික පත්‍ර පාඨමාලාවක් අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම

- වැටුප් පරිමාණය : MA 2-1 : රු. [50,540 – 10 x 540 – 7x 630 – 4 x 890 -20 x 1,190 – 87,710] (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන II ට අනුව, රු. 50,540/= ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලබන අතර 2025 වර්ෂය සඳහා ආරම්භක වැටුප රු. 43,379/= කි)

- වයස් සීමාව : අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට වඩා නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

- බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත තරඟ විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 10. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA 1-1 - III ශ්‍රේණිය)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් :

(අ) අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් පහත විෂයන් ඇතුලත්ව විෂයයන් හතරක් (04) සඳහා සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.

i. සිංහල / දෙමළ
ii. ඉංග්‍රීසි භාෂාව
iii. ගණිතය

(ආ) (i) අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් (සාමාන්‍ය ප්‍රශ්න පත්‍රය හැර) විෂයයන් 03ක් සමත් වී තිබීම.

සහ

(ඇ) මාස හයකට නොඅඩු පරිගණක සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

පහත සඳහන් සුදුසුකම් ඇති ප්‍රාථමික මට්ටම - පුහුණු (PL-3) , ප්‍රාථමික මට්ටම - අර්ධ පුහුණු (PL-2) සහ ප්‍රාථමික මට්ටම - නුපුහුණු (PL-1) යන කාණ්ඩවල සේවකයින්ට අයදුම් කිරීමට සුදුසුකම් ලැබේ.

**අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් :**

(අ) අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් පහත විෂයන් ඇතුලත්ව විෂයයන් හතරක් (04) සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.

i. සිංහල / දෙමළ
ii. ඉංග්‍රීසි භාෂාව
iii. ගණිතය

(ආ) මාස හයකට නොඅඩු පරිගණක සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.

**වෙනත්:** ඉහත සේවා කාණ්ඩය යටතේ ස්ථිර තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සටහන:** ස්ථිර තනතුරකට පත් කිරීමට පෙර සේවා කාලයක් හෝ ඕනෑම තනතුරකට ස්ථිර පදනමක් මත පත් කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් ලෙස පුහුණුව යටතේ සම්පූර්ණ කළ යුතු සේවා කාලයක් ඉහත සඳහන් කළ පරිදි සුදුසුකම් සඳහා අවශ්‍ය සේවා කාලය තුළ ගණන් නොගත යුතුය. අනියම්/තාවකාලික පදනම මත කරන ලද ඕනෑම සේවා කාලයක් ද මේ සඳහා ගණන් නොගත යුතුය.

- වැටුප් පරිමාණය : MA 1-1 : රු. [46,220 – 10 x 540 – 7x 630 – 4 x 890 -20 x 1,190 – 83,390]
  (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන II ට අනුව, රු. 46,220/= ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලබන අතර 2025 වර්ෂය සඳහා ආරම්භක වැටුප රු. 40,403/= කි)

- වයස : අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
  අභ්‍යන්තර අයදුම්කරුවන්ට ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

- බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත තරඟ විභාගය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 11. රියදුරු - (PL - 3 - III ශ්‍රේණිය)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් :**

1. උපරිම වාර දෙකකදී අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් විෂයන් හයක් (06) සමත් වීම

සහ

2. බර වාහන පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රය ලබා තිබීම.

සහ

3.රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව රිය පැදවීම පිළිබඳ අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද

සහ

4. ලංකා ගමනා ගමන මණ්ඩලය විසින් සිදු කරන ලද රියදුරු පරීක්ෂණයෙන් සමත්වීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

1. බර වාහන පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රය ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීමේ පිළිබඳ අවම වශයෙන් වසර තුනක පළපුරුද්දක් ලබා තිබීම සහ ලංකා ගමනා ගමන මණ්ඩලය විසින් පවත්වනු ලබන රියදුරු පරීක්ෂණයෙන් සමත්වී තිබීම

සහ

2. ප්‍රාථමික අර්ධ පුහුණු (PL-2) හෝ ප්‍රාථමික නුපුහුණු (PL-1) කාණ්ඩයේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

- වැටුප් පරිමාණය : PL-3 - රු. 43,280/= – 10 x 490 - 10 x 540-10x 590- 12 x 630– 67,040/= (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන II ට අනුව, රු. 43,280/= ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලබන අතර 2025 වර්ෂය සඳහා ආරම්භක වැටුප රු. 38,387/= කි)

- වයස : අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

- බඳවා ගැනීමේ ක්‍රමය: ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 12. ඖෂධ නිමාකිරීමේ සහායක (PL -2 – III ශ්‍රේණිය)

**සුදුසුකම්:**

**බාහිර අයදුම්කරුවන් (පහත 1, 2, හෝ 3)**

(1) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ඖෂධ ඇසුරුම්කරණයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 2 ට (NVQ 2) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

(2) සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි විෂයයන් සඳහා සම්මාන 04ක් සමගින් අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් විෂයන් හයක් (06) සමත් වී තිබීම.

සහ

ඖෂධ ඇසුරුම්කරණයේ වසරක පළපුරුද්ද.

(3) අභ්‍යාසලාභීන් බඳවා ගැනීම

සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි විෂයයන් සඳහා සම්මාන 04ක් සමඟින් අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් විෂයන් හයක් (06) සමත් වී තිබීම.

සහ

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ පුහුණුවන ඖෂධ නිමාකිරීමේ සහායක ලෙස වසරක පුහුණු කාලයක් සම්පූර්ණ කළ පසු ඖෂධ නිමාකිරීමේ සහායක ලෙස ස්ථිර සේවයට බඳවාගනු ලැබේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

**1.** ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

**2.** වෘත්තීය පරීක්ෂණයකින් සනාථ කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම **2** ට (NVQ 2) නොඅඩු නිපුණතාව සමග අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර ඇති නුපුහුණු මට්ටමේ සේවකයින්.

- වැටුප් පරිමාණය : PL-2 - රු. 42,300/= – 10 x 490 - 10 x 540-10x 590- 12 x 630– 66,060/=
  (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි II වන උපලේඛනයට අනුව, රු. 42,300/= ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලබන අතර 2025 වර්ෂය සඳහා ආරම්භක වැටුප රු. 37,715/= කි)

- වයස : අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
  අභ්‍යන්තර අයදුම්කරුවන්ට ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

- බඳවා ගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 13. වැඩ සහායක - (PL-1 – III ශ්‍රේණිය)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටීම.

- වැටුප් පරිමාණය : PL-1 - රු. 40,500/= – 10 x 450 - 10 x 490- 7x 540- 15 x 590– 62,530/=
  (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන II ට අනුව, රු. 40,500/= ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලබන අතර 2025 වර්ෂය සඳහා ආරම්භක වැටුප රු. 36,475/= කි)

- වයස : අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

- බඳවා ගැනීමේ ක්‍රමය: ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**ආන්තික ප්‍රතිලාභ:**

- පැමිණීමේ සහ කාර්ය සාධන දිරිදීමනා.
- උපයෝගී කර නොගත් වාර්ෂික සහ අසනීප නිවාඩු මුදල් ගෙවීම.
- වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සහ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය.
- සංස්ථාව විසින් වැටුපෙන් 15%ක් හා සේවකයා 10%ක් වශයෙන් සේවක අර්ථසාධක අරමුදලට දායක වීම.
- සංස්ථාව විසින් වැටුපෙන් 3%ක් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක වීම.
- 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා පනත සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛයට අනුව පාරිතෝෂිකය ගෙවනු ලැබේ.
- වෙනත් ආන්තික ප්‍රතිලාභ.

**පොදු උපදෙස්:**

- නියමිත ආකෘති පත්‍ර වල සකසන ලද අයදුම්පත් ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ විමසුම් විස්තර සමඟ ඉදිරිපත් කළ යුතුය. සියලුම අධ්‍යාපන සහතිකවල සහතික කළ පිටපත් අයදුම්පත්‍රය සමඟ අමුණා තිබිය යුතුය. අදාළ අයදුම් පත්‍රය ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිල වෙබ් අඩවිය වන https://www.spmc.gov.lk වෙතින් බාගත කර ගත හැකිය.
- රජයේ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් හරහා යොමු කළ යුතු අතර, ඔවුන් තෝරාගනු ලැබුවහොත්, පත්වීම ලබා ගැනීම සඳහා අයදුම්කරු නිදහස් කළ හැකිද යන්න සහතික කළ යුතුය.
- ඉල්ලුම් කරන තනතුර අයදුම්පත බහාලු ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු අතර, අයදුම්පත් මෙම දැන්වීම පළ වී දින 10ක් ඇතුළත පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
- ඉහත අවශ්‍යතාවලට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- අයදුම්කරුවෙකු තනතුරු එකකට වඩා අයදුම් කරන්නේ නම්, එක් එක් තනතුරු සඳහා සහතික වල පිටපත් සමග වෙන වෙනම ලියුම් කවර වල බහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

**සභාපති**
**රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව**
**අංක 11, සර් ජෝන් කොතලාවල මාවත**
**කඳවල වත්ත - රත්මලාන.**